## විධායක සාරාංශය (Executive Summary)

### ව්‍යාපෘති දළ විශ්ලේෂණය

ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) බලශක්ති සම්ප්‍රේෂණය සඳහා වගකිවයුතු අනුප්‍රාප්තික ආයතනය වන **The National Transmission Network Service Provider (Private) Limited** විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ නව හබරණ ග්‍රිඩ් උප පොළ (SS) සිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කප්පල්තුරෙයි ජාල උප පොළ (GS) දක්වා කිලෝමීටර් 77 ක් පමණ දිගින් යුත් ද.වෝ. 220 ක අධි වෝල්ටීයතා සම්ප්‍රේෂණ මාර්ගයක් ඉදිකිරීමට යෝජනා කර ඇත. මෙම සම්ප්‍රේෂණ මාර්ගය මගින් නැගෙනහිර පළාත් විදුලිබල ජාලය ශක්තිමත් කිරීම, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් විදුලිය ලබාගැනීම සහ ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල පද්ධතිය තුළ දිගු දුර සම්ප්‍රේෂණ ධාරිතාව වැඩිදියුණු කිරීම සිදු කෙරේ.

දැනට පවතින පැරණි අනුරාධපුර - ත්‍රිකුණාමලය ද.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ගයෙන් විදුලි සැපයුමේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් අවදානමක් පවතින අතර. ත්‍රිකුණාමල වරාය සහ කර්මාන්තපුරයේ වර්ධනය වන විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා නව හබරණ සිට කප්පල්තුරෙයි දක්වා මෙම නව ද.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය යෝජනා කර ඇත, එමගින් මෙගා වොට් 2,000ක විදුලි ධාරිතාවක් ලබාගැනීමට සහ විශ්වසනීය විදුලි සැපයුමක් සහතික කිරීමට හැකි වේ. මෙම ව්‍යාපෘතිය රජයේ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධතා වැඩසටහනේ කොටසක් වන අතර, ෆොසිල ඉන්ධන මත යැපීම අවම කිරීම සහ බලශක්ති සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම මෙහි අරමුණයි. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) මෙම ව්‍යාපෘතිය සඳහා විභව අරමුදල් සපයන ආයතනය ලෙස හඳුනාගෙන ඇත.

### පාරිසරික සහ සමාජීය බලපෑම් තක්සේරුවේ (ESIA) අරමුණ සහ ව්‍යාපෘති විෂය පථය

මෙම පාරිසරික හා සමාජීය බලපෑම් ඇගයීම (ESIA) සකස් කර ඇත්තේ යෝජිත සම්ප්‍රේෂණ මාර්ගය, එහි උප පොළවල් සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට සම්බන්ධ පාරිසරික හා සමාජීය අවදානම් තක්සේරු කිරීමට, වළක්වා ගැනීමට, අවම කිරීමට සහ කළමනාකරණය කිරීමට ය. මෙම ඇගයීම ශ්‍රී ලංකාවේ ජාතික පරිසර පනත (NEA), ශ්‍රී ලංකා විදුලිබල පනත සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) පාරිසරික හා සමාජීය රාමුව (ESF) සමඟ අනුකූල වේ. මෙය සම්ප්‍රේෂණ මාර්ගය, තාවකාලික ඉදිකිරීම් ප්‍රවේශ මාර්ග සහ ඒ ආශ්‍රිත පහසුකම්වල සෘජු, වක්‍ර සහ සමුච්චිත බලපෑම් ආමන්ත්‍රණය කරයි. මෙම ESIA වාර්තාව මූලික පාරිසරික හා සමාජීය තත්ත්වයන්, අපේක්ෂිත ව්‍යාපෘති බලපෑම් සහ අවම කිරීමේ පියවරයන් පිළිබඳ පුළුල් ඇගයීමක් සපයන අතර, එය ව්‍යාපෘතියේ පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලැස්ම (ESMP) සඳහා පදනම සපයයි.

## <u>ව්‍යාපෘතියේ සාධාරණීකරණය</u>

නාගරීකරණය, කාර්මික සංවර්ධනය සහ ගෘහස්ථ පරිභෝජනය ඉහළ යාම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වාර්ෂික විදුලි ඉල්ලුම 5%–6%ක අනුපාතයකින් අඛණ්ඩව වර්ධනය වේ. පුනර්ජනනීය බලශක්ති ධාරිතාව පුළුල් කිරීම රජයේ දිගුකාලීන බලශක්ති සැලැස්ම යටතේ ප්‍රමුඛතාවයකි. මෙම කලාපයේ ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කිහිපයකින් විදුලිය සම්ප්‍රේෂණය කිරීමට සහ නැගෙනහිර පළාත් විදුලිබල ජාලයේ **විශ්වසනීයත්වය** වැඩිදියුණු කිරීමට නව හබරණ–කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ මාර්ගය අත්‍යවශ්‍ය වේ. මෙම මාර්ගය නොමැතිව, සැලකිය යුතු පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතියට ඵලදායී ලෙස ඒකාබද්ධ කළ නොහැක. ව්‍යාපෘති කටයුතු දේශීය සහ AIIB ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරනු ලබන අතර, එහි පාරිසරික බලපෑම අවම මට්ටමක පවතින බැවින්, මෙම ව්‍යාපෘතිය තාක්ෂණික වශයෙන් සහ උපායමාර්ගික වශයෙන් සාධාරණීකරණය කර ඇත.

## <u>මූලික පාරිසරික සහ සමාජීය තත්ත්වයන්</u>

මෙම සම්ප්‍රේෂණ මාර්ගය වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර, ගංගා ආශ්‍රිත වාසස්ථාන, පඳුරු සහිත ලැහැබ, කුඹුරු යායවල්, ගෙවතු සහ මුඩු ඉඩම් ඇතුළු විවිධ භූ දර්ශන හරහා ගමන් කරයි. ජෛව විද්‍යාත්මක මූලික දත්ත මගින් වියළි කලාපීය ශාක හා සත්ත්ව විශේෂවල පැවැත්ම තහවුරු කෙරෙන අතර, ඊට ශ්‍රී ලංකාවට ආවේණික වූ සහ ජාතික වශයෙන් වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂ කිහිපයක් ද අයත් වේ. මෙම සම්ප්‍රේෂණ මාර්ගයේ ඇතැම් කොටස්, ගංගා ආශ්‍රිත වනාන්තර සහ සෘතුමය තෙත්බිම් වැනි පාරිසරික වශයෙන් සංවේදී කලාප හරහා ගමන් කරයි.

මෙම කලාපයේ සමාජ-ආර්ථික පරිසරය ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ස්වභාවයක් ගන්නා අතර, එහි ජීවනෝපායන් කෘෂිකර්මාන්තය, පශු සම්පත් පාලනය සහ කන්න ආශ්‍රිත වැටුප් ශ්‍රමය මත පදනම් වී ඇත. මෙහි ඇති ජනාවාස, ගෙවතු, ආගමික ස්ථාන, පාසල් සහ පොදු යටිතල පහසුකම් පිහිටා තිබෙන්නේ මාර්ග පද්ධතිය ආශ්‍රිතවය. කාලයකට පමණක් ඇතිවන ගංවතුර සහ නියඟය මෙම ප්‍රදේශයේ නිතර දක්නට ලැබෙන ස්වාභාවික ආපදා වේ

ඉහත සඳහන් මූලික තත්ත්වයන් හඳුනාගනු ලැබුවේ පුළුල් ක්ෂේත්‍ර නිරීක්ෂණ, පවුල් ඒකක සමීක්ෂණ සහ ප්‍රජාව මෙන්ම අදාළ ආයතනික පාර්ශ්වකරුවන් සමඟ සිදු කරන ලද සාකච්ඡා හරහාය. මෙම ක්ෂේත්‍ර නිරීක්ෂණ මෙහෙයුම්වලදී, ප්‍රජාව සහ අදාළ රාජ්‍ය ආයතන විසින් මතු කරන ලද ගැටලු සහ කරුණු ඉතා පූර්ණ ලෙස විමර්ශනය කරන ලදී.

## <u>ප්‍රධාන පාරිසරික සහ සමාජීය බලපෑම්</u>

**භෞතික පරිසරය:** ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවධියේදී බර යන්ත්‍රෝපකරණ සහ වාහන භාවිතය හේතුවෙන් දූවිලි විමෝචනය, ශබ්දය, කම්පනය සහ වාතයේ ගුණාත්මකභාවය පිරිහීම වැනි පාරිසරික බාධා ඇති විය හැකිය. විශේෂයෙන්ම කැනීම් සහ කුලුනු පාදම ඉදිකිරීමේදී කුඹුරු ඉඩම් සහ පඳුරු සහිත ලැහැබ්වල පස සංයුක්ත වීම සහ ඛාදනය වීමේ අවදානමක් පවතී. මතුපිට ජල ගලනය වෙනස් වීම සහ කුඩා වැව්, ඇළ මාර්ග සහ

ජලාපවහන පද්ධතිවලට බාධා ඇති විය හැකි වුවද, නිසි ස්ථානීය පියවර මගින් මෙම බලපෑම් අවම කර ගත හැකිය. එමෙන්ම, අපද්‍රව්‍ය එකතු වීම, ද්‍රව්‍ය ප්‍රවාහනය හේතුවෙන් ඇතිවන රථවාහන තදබදය සහ මෘදු පස් සහිත ප්‍රදේශවල භූ විද්‍යාත්මක අවදානම් ද සැලකිය යුතු කරුණු වේ. මෙහෙයුම් අවධියේදී ඇතිවන බලපෑම් අවම වුවද, භූ දර්ශනයේ දෘශ්‍ය වෙනස්කම් සහ සම්ප්‍රේෂණ මාර්ගයේ කොරිඩෝව තුල ඉඩම් භාවිතය මත යම් සීමාවන් දිගටම පවතිනු ඇත.

**ජෛව පරිසරය:** මීටර් 35ක පළලින් යුත් සම්ප්‍රේෂණ මාර්ගයේ කොරිඩෝව තුල (මුළු වපසරිය හෙක්ටයාර් 271ක් පමණ) ශාක ඉවත් කිරීම කුඹුරු (43.7%), තුනී වනාන්තර (25.8%), පඳුරු සහිත ලැහැබ් (16.1%), ගෙවතු (12.6%) සහ වගුරු බිම්වලට බලපෑම් කරනු ඇත. පාරිසරික වශයෙන් වැදගත් විශේෂ ඇතුළුව ගස් 8,197ක් පමණ ඉවත් කිරීමට සිදුවේ. වාසස්ථාන අහිමි වීම සහ ඛණ්ඩනය වීම හේතුවෙන් කුඩා ක්ෂීරපායින්, උරගයින් සහ බිමෙහි කැදලි සාදන පක්ෂීන්ට බලපෑම් සිදුවිය හැකි අතර, වනාන්තර මායිම්වල ශාක ඉවත් කිරීම නිසා හුරුළු පරිසර උද්‍යානය අසල ගම්වැසියන් සහ වන සතුන් අතර අන්තර්ක්‍රියා වැඩි වීමට හේතු විය හැක. ව්‍යාපෘති ප්‍රදේශයේ හමුවන ආවේණික සහ ජාතික වශයෙන් වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ශාක හා සත්ත්ව විශේෂ සඳහා විශේෂ ආරක්ෂණ පියවර අවශ්‍ය වේ. මෙහෙයුම් අවධියේදී, පක්ෂීන් විදුලි රැහැන්වල ගැටීම සහ සම්ප්‍රේෂණ මාර්ගයේ කොරිඩෝව ඔස්සේ ආක්‍රමණශීලී ශාක ව්‍යාප්ත වීමේ අවදානම සැලකිල්ලට ගෙන ඇත.

**ජලජ සම්පත්:** මෙම සම්ප්‍රේෂණ මාර්ගය විවිධ වාරි ඇළ මාර්ග, දිය පහරවල් සහ මහවැලි ගංගා ද්‍රෝණියේ කොටස් හරහා ගමන් කරයි. ඉදිකිරීම් කටයුතු හේතුවෙන් අවසාදිත තැන්පත් වීම, ජලයේ ගුණාත්මකභාවය පිරිහීම සහ ජල ගලනයට බාධා ඇතිවීමේ අවදානමක් පවතී. AP30 සහ AP46 යන කුලුනු අසල පිහිටි වගුරු බිම් (හෙක්ටයාර් 0.94) පාරිසරික වශයෙන් සංවේදී වන අතර, ඉදිකිරීම් ප්‍රවේශ මාර්ග නිසා ඒවායේ ජලාපවහනයට බලපෑම් ඇතිවිය හැකිය. ජලජ පරිසරයට සිදුවන බලපෑම් අවමකිරීම සඳහා කුලුනු ඉදිකිරීමේදී උපරිම සැලකිල්ල යොමු කිරීම, අවසාදිත බාධක (sediment barriers) යෙදීම සහ ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම පාලනය කිරීමට සැලසුම් කර ඇත.

**සමාජීය බලපෑම්:** ව්‍යාපෘතිය නිසා ජනතාව අවතැන් වීමක් අපේක්ෂා නොකෙරේ, කෙසේ වෙතත්, ඇතැම් නිවාස, ළිං, වැටවල් සහ අනෙකුත් සහායක ව්‍යුහයන් සම්ප්‍රේෂණ මාර්ගයේ කොරිඩෝව තුළ පිහිටා ඇති බැවින් ඒවා සඳහා වන්දි ගෙවීමට හෝ නැවත පදිංචි කිරීමේ සහාය ලබා දීමට සිදු විය හැකිය. බලපෑමට ලක්වන ග්‍රාම නිලධාරි වසම් 22 තුළ පුද්ගලයින් 52,115ක් පමණ වාසය කරන අතර ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය මත පදනම් වේ. කුලුනු අත්තිවාරම් දැමීම සහ ඉදිකිරීම් ප්‍රවේශ මාර්ග හේතුවෙන් ගොවීන්ට තාවකාලික බාධා ඇතිවිය හැකි අතර, කුඹුරු සහ ගෙවතු තුළ කුලුනු පිහිටුවන ස්ථානවල ස්ථිර ඉඩම් අහිමි වීමක් සිදුවේ. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන මුළු ඉඩම් කොටස් සංඛ්‍යාව 690ක් වන අතර එය පුද්ගලයින් 678කට අයත් වේ. කාන්තාවන් මූලික වන පවුල් සහ කුඩා පරිමාණ ගොවීන් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ජීවනෝපායන්ට යම් බලපෑම් එල්ල විය හැකිය. ඉදිකිරීම් කාලසීමාවේදී කම්කරුවන් පැමිණීම, නිසි ලෙස කළමනාකරණය

නොකළහොත්සමාජ ආතතීන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයසහ දේශීය සේවාවන් මත පීඩනයක් ඇතිවීමේ අවදානමක් පවතී.

**සංස්කෘතික උරුමයන්:** මෙම කලාපය තුළ වැදගත් ආගමික සහ පුරාවිද්‍යාත්මක ස්ථාන (උදා: තිරියාය ශිව දේවාලය, වෙල්ගම් වෙහෙර සහ මැදිරිගිරිය) පිහිටා තිබුණද, ඉන් කිසිවක් ව්‍යාපෘතියේ සෘජු බලපෑමට ලක්වන කලාපය (AoI) තුළ නොමැත. එබැවින්, සංස්කෘතික උරුමයන් මත සෘජු බලපෑමක් අපේක්ෂා නොකෙරේ. කෙසේ වෙතත්, කැණීම් කටයුතුවල දී පුරාවස්තු අහඹු ලෙස හමුවුවහොත් ඒ සඳහා අනුගමනය කළ යුතු “අහඹු සොයා ගැනීම්” (chance find) ක්‍රියා පටිපාටියක් පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලැස්මට (ESMP) ඇතුළත් කර ඇත.

**දේශගුණික අවදානම්:** දේශගුණික අවදානම් තක්සේරු කිරීම්වලට අනුව, ව්‍යාපෘති ප්‍රදේශය කාලයකට පමණක් ඇතිවන නියඟය, දැඩි වර්ෂාපතනය, ගංවතුර, අධික සුළං සහ අකුණු සැර වැදීමේ අවදානමට ලක් ව ඇත. Intergovernmental Panel on Climate Change (IPCC)දේශගුණික අවස්ථා (scenarios) යටතේ ගංවතුර ඇතිවීමේ වාර ගණන සහ උෂ්ණත්වයේ ඉහල යෑම් වැඩි වනු ඇතැයි පුරෝකථනය කෙරේ. ජල විද්‍යාත්මක ආකෘති නිර්මාණය මගින් පෙන්වා දෙන්නේ විශේෂයෙන්ම දේශගුණික විපර්යාසයන්හිදී ගංවතුර මට්ටම ඉහළ යා හැකි බවයි. එබැවින්, පහත් බිම්වල ඇති කුලුනු අත්තිවාරම් ඉහළ නැංවීමට අවශ්‍ය වේ. ඒ අනුව, AIIB සහ ජාතික දේශගුණික අනුවර්තන ප්‍රමිතීන්ට අනුකූලව, අධික කාලගුණික තත්ත්ව යන්ට, ප්‍රබල සුළංවලට සහ අනාගත දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන පරිදි සම්ප්‍රේෂණ මාර්ග ව්‍යුහයන් සැලසුම් කර ඇත.

## අනුබද්ධිත පහසුකම්

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ පාරිසරික හා සමාජීය රාමුව (AIIB ESF) යටතේ, ද.වෝ. 220 සාම්පූර්-කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ මාර්ගය, නව හබරණ-කප්පල්තුරෙයි (NH-K) සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතියේ අනුබද්ධිත පහසුකමක් (Associated Facility - AF) ලෙස හඳුනාගෙන ඇත. නැගෙනහිර පළාතේ සිට ජාතික විදුලිබල පද්ධතිය වෙත පුනර්ජනනීය බලශක්තිය ලබාගැනීම සහ සම්ප්‍රේෂණය කිරීම සඳහා මෙම ව්‍යාපෘති දෙකම අත්‍යවශ්‍ය වීම මීට හේතුවයි.
මෙම ව්‍යාපෘති දෙකම ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන සමුච්චිත බලපෑම් (cumulative impacts), එනම් තාවකාලික ඉදිකිරීම් බාධා, පාරිසරික බලපෑම්, සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂණ අවදානම් මෙම පාරිසරික හා සමාජීය බලපෑම් ඇගයීම (ESIA) මගින් සලකා බලා ඇත. මෙම බලපෑම් දේශීය මට්ටමට සීමා වන අතර, අදාළ පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලසුම් (ESMPs) හරහා ඒවා කළමනාකරණය කළ හැකි බව අපේක්ෂා කෙරේ. තවද, මෙම ව්‍යාපෘති ඒකාබද්ධ වීම තුළින් විදුලිබල ජාලයේ විශ්වසනීයත්වය වැඩිදියුණු වීම, පුනර්ජනනීය බලශක්තිය පද්ධතියට ඒකාබද්ධ කිරීම සහ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම වැනි සැලකිය යුතු ප්‍රතිලාභ රැසක් සමස්තයක් ලෙස හිමිවනු ඇත.

## අවම කිරීමේ පියවර සහ පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලැස්ම (ESMP)

මූලික සැලසුම්කරණයේදීම අවම කිරීමේ පියවරයන් (mitigation-by-design) ඒකාබද්ධ කර ඇති අතර ඒවා පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලැස්ම (ESMP) තුළ විස්තරාත්මකව දක්වා ඇත. එහි ප්‍රධාන පියවරයන්ට පහත ඒවා ඇතුළත් වේ:

- **මාර්ගය ප්‍රශස්තකරණය:** ජනාවාස සහ සංවේදී වාසස්ථාන මඟහැරෙන පරිදි සම්ප්‍රේෂණ මාර්ග සැලසුම ප්‍රශස්තකරණය කිරීම.
- **සැලසුම්ගත පියවරයන්:** බලපෑම අවම කිරීම සඳහා, මධ්‍ය රේඛාවේ සිට දෙපසට මීටර් 6ක් ඇතුළත දැනට පවතින ව්‍යුහයන් පිහිටා ඇති ස්ථානවලදී අවමවශයෙන් මීටර් 5.48ක නිදහස් ඉඩක් (clearance) ලබාදීම සහ සැලසුම්ගත අවම කිරීමේ පියවරයන් (උදා: කුලුනු උස වැඩි කිරීම් / tower extensions) ඇතුළත් කිරීම.
- **වන්දි ලබා දීම:** ශ්‍රී ලංකා විදුලිබල පනත සහ AIIB ප්‍රමිතීන්ට අනුව ඉඩම්, වගාවන් සහ ව්‍යුහයන් සඳහා ප්‍රතිස්ථාපන පිරිවැය (replacement cost) යටතේ වන්දි ගෙවීම.
- **පාරිසරික ආරක්ෂණය:** පාලනයකින් යුතුව භූමිය එළි පෙහෙළි කිරීම, ජීවී විශේෂ සුරක්ෂිත ස්ථාන වෙත ගෙන යාම (translocation) සහ වාසස්ථාන සුපෝෂණ වැඩසටහන් ඇතුළු පාරිසරික බලපෑම් අවම කිරීමේ පියවර.
- **භූමි කළමනාකරණය:** පාංශු ඛාදනය සහ අවසාදිත තැන්පත්වීම පාලනය කිරීම, ආරක්ෂිත ජලාපවහනය සහ ගංවතුරට ඔරොත්තු දෙන පරිදි කුලුනු සැලසුම් කිරීම.
- **ප්‍රජා සහ මාර්ග ආරක්ෂාව:** ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව කළමනාකරණය, පිටස්තර ශ්‍රමිකයන්ගේ පැමිණීම පාලනය කිරීම සහ රථවාහන කළමනාකරණය.
- **වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය :** වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ මාර්ගෝපදේශ, හදිසි අවස්ථා සඳහා සූදානම් වීම සහ සේවකයින් පුහුණු කිරීම.
- **පැමිණිලි විසඳීම:** බලපෑමට ලක්වූ පුද්ගලයින්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයක් (GRM) ස්ථාපිත කිරීම.
- **කම්කරු කළමනාකරණය:** ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී (gender-sensitive) කම්කරු කළමනාකරණ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම.
- **පාර්ශ්ව කරුවන්ගේ සහභාගීත්වය:** ව්‍යාපෘතියේ සැලසුම් සහ ඉදිකිරීම් කාලය පුරාම පාර්ශ්ව කරුවන්ගේ අදහස් ලබාගැනීම සහ උපදේශනයන් පුළුල් කිරීම.
- **සමාජ වගකීම් ක්‍රියාකාරකම් (CSR):** පලතුරු පැළ ලබා දීම, ප්‍රජා ශාලා වැඩිදියුණු කිරීම වැනි ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් සිදු කිරීම.

පාරිසරික සහ සමාජීය අධීක්ෂණ සැලැස්මේ (ESMoP) අධීක්ෂණය යටතේ, පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලැස්ම (ESMP) මඟින් මෙම අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා වගකීම්, කාල රාමු සහ අධීක්ෂණ දර්ශක (monitoring indicators) සපයනු ලබයි.

## ආයතනික විධිවිධාන

පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලැස්මට (ESMP) අනුකූල වන බව සහතික කිරීම සහ ව්‍යාපෘති කාලය පුරා ආරක්ෂණ පියවරයන් (safeguard measures) අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු පාරිසරික සහ සමාජීය (E&S) ඒකකයකින් සමන්විත වූ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) හරහා NTNSP ආයතනය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මෙහෙයවනු ඇත. මෙම ඒකකය කොන්ත්‍රාත්කරුවන්, ප්‍රාදේශීය බලධාරීන්, මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මධ්‍යම පරිසර අධිකාරිය වැනි නියාමන හා අධීක්ෂණ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරනු ඇත.

ක්ෂේත්‍ර මට්ටමේ පාරිසරික අංශ විසින් අදාළ ස්ථානයන්හි දෛනික අධීක්ෂණ සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබන අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා NTNSP කාර්ය මණ්ඩලය, කොන්ත්‍රාත්කරුවන් සහ අදාළ පාර්ශ්වකරුවන් ඉලක්ක කරගනිමින් ධාරිතා වර්ධන වැඩසටහන් හරහා ආයතනික සවිබල ගැන්වීම් සිදු කරනු ලැබේ. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) අවශ්‍යතාවලට අනුකූලව, ව්‍යාපෘතියේ ප්‍රමිතීන්ට ඇති අනුකූලතාවය සහ කාර්යසාධනය ස්වාධීනව තහවුරු කිරීම සඳහා තෙවන පාර්ශ්වීය අධීක්ෂණ ආයතනයක් (third-party monitoring agency) සම්බන්ධ කරගනු ලබන අතර, එමඟින් සමස්ත ව්‍යාපෘති කාලසීමාව පුරාවටම විනිවිදභාවය, අනුවර්තනීය කළමනාකරණය (adaptive management), කාලෝචිත ලෙස පැමිණිලි විසඳීම සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය අවශ්‍ය පරිදි සහතික කරනු ඇත.

## <u>පාර්ශ්ව කරුවන් සම්බන්ධ කර ගැනීම</u>

ප්‍රාදේශීය ප්‍රජාවන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි පරිපාලන ආයතන, වන සංරක්ෂණ සහ වනජීවී අධිකාරීන් ඇතුළු පාරිසරික නියාමන ආයතන මෙන්ම සිවිල් සමාජ නියෝජිතයින් සමඟ පුළුල් ලෙස උපදේශන සහ සාකච්ඡා පවත්වන ලදී.

මෙහිදී මතු කරන ලද ගැටලු සහ කරුණු අතර, ගෙවතු සහ කුඹුරුවල ඉඩම් මෙන්ම වෘක්ෂලතා හෝ බෝග අහිමි වීම සඳහා මූල්‍යමය වන්දි ලබාදීමේ අවශ්‍යතාව, ප්‍රවේශ මාර්ගවලට ඇති වන බාධා සහ ගස් කපා ඉවත් කිරීම වැනි සිදු විය හැකි පාරිසරික බලපෑම් ප්‍රධාන විය.

මෙම ගැටලු යෝජිත බලපෑම් අවම කිරීමේ පියවරයන්ට සහ පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලැස්මට (ESMP) ඇතුළත් කර ඇත. තවද, ප්‍රජාවගේ පැමිණිලි ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට, ඒවාට නිසි විසඳුම් ලබා දීමට සහ ගැටලු අවම කිරීම සහතික කිරීම සඳහා බහු-ස්තර දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයක් (multi-tiered GRM) ද ස්ථාපිත කර තිබේ.

බලපෑමට ලක්වන පුද්ගලයින් ඇතුළු සියලු ම පාර්ශ්ව කරුවන් සමඟ ව්‍යාපෘතියට අදාළ තොරතුරු බෙදා හදා ගැනීමටත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සහ ඒවායේ බලපෑම් පිළිබඳ ව ඔවුන්ගේ ප්‍රතිපෝෂණ (feedback)

ලබා ගැනීමටත්, සමස්ත ව්‍යාපෘති කාල චක්‍රය පුරාවටම පාර්ශ්වකරුවන් අඛණ්ඩව සම්බන්ධ කර ගැනීම සහ තොරතුරු විවෘතව අනාවරණය කිරීම අත්‍යවශ්‍ය වේ.

## නිගමන සහ නිර්දේශ

නව හබරණ - කප්පල්තුරෙයි ද.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය පාරිසරික සහ සමාජීය වශයෙන් ශක්‍යතාවක් සහිත එකක් බව මෙම පාරිසරික හා සමාජීය බලපෑම් ඇගයීම (ESIA) මඟින් නිගමනය කරයි. මෙහිදී ආපසු හැරවිය නොහැකි (irreversible) බලපෑම් කිසිවක් අපේක්ෂා නොකරන අතර, හඳුනාගෙන ඇති බලපෑම්, පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලැස්මට (ESMP) දැඩි ලෙස අනුකූලව කටයුතු කිරීම හරහා අවම කරගත හැකිය. මෙම ව්‍යාපෘතිය මඟින් ජාතික පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය අන්තර්ග්‍රහණය කිරීම වැඩිදියුණු කිරීමත්, නැගෙනහිර පළාත් විදුලිබල ජාලය ශක්තිමත් කිරීමත් සිදු කරන අතර, ශ්‍රී ලංකාව තිරසාර බලශක්තියක් කරා ගමන් කිරීමේ ක්‍රියාවලිය සඳහා එය මහත් සේ දායක වනු ඇත. ඒ අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් කරුණු අනුගමනය කරමින් ඉදිරියට යා යුතු බවට නිර්දේශ කෙරේ:

- පාරිසරික සහ සමාජීය ආරක්ෂණ පියවරයන්ට (safeguards) පූර්ණ ලෙස අනුකූල වීම.
- පාර්ශ්වකරුවන් අඛණ්ඩව සම්බන්ධ කරගැනීම සහ පැමිණිලි විසඳීම.
- පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලැස්ම (ESMP) සහ පාරිසරික හා සමාජීය අධීක්ෂණ සැලැස්ම (ESMoP) යටතේ දැඩි ලෙස අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.
- ස්වාධීන අධීක්ෂණය සහ අනුවර්තනීය කළමනාකරණය (adaptive management).

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ පාරිසරික හා සමාජීය රාමුවේ (AIIB ESF) මාර්ගෝපදේශයන්ට අනුව මෙම ව්‍යාපෘතිය ‘B’ කාණ්ඩයට අයත් වන අතර, ජාතික පරිසර පනත (NEA) යටතේ, මධ්‍යම පරිසර අධිකාරිය (CEA) වෙත ඉදිරිපත් කරන ලද මූලික පාරිසරික පරීක්ෂණ (IEE) වාර්තාව මත පදනම් ව, 2024 පෙබරවාරි 19 දිනැති කොන්දේසි සහිත අනුමැතිය මධ්‍යම පරිසර අධිකාරිය විසින් ව්‍යාපෘතිය සඳහා දැනටමත් ලබා දී ඇත. එබැවින්, මෙම ව්‍යාපෘතිය AIIB අරමුදල් සඳහා අනුමත කරන ලෙස උපදේශකවරුන් විසින් යෝජනා කරනු ලැබේ.